MINISTRY OF EDUCATION

අධ්‍යාපන අමාත්‍යාංශය

G.C.E. ORDINARY LEVEL - Rehearsal Paper

අ.පො.ස. සාමාන්‍ය පෙළ - ආදර්ශ ප්‍රශ්න පත්‍ර

GEOGRAPHY

භූගෝල විද්‍යාව

# QUESTION PAPER - I

# ප්‍රශ්න පත්‍රය - I



අනුග්‍රහය :

# අධ්‍යාපන අමාත්‍යාංශය

## භූගෝල විද්‍යාව - I

## අ.පො.ස. (සා/ පෙළ) - ආදර්ශ ප්‍රශ්න පත්‍රය

**11 ශ්‍රේණිය** **කාලය - පැය 1 යි**

සැළකිය යුතුයි

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුයි.
- එක් ප්‍රශ්නයකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 40 යි.

**1 සිට 10 දක්වා ප්‍රශ්නවල එක් එක් හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා තිත් ඉර මත ලියන්න.**

1' පෘථිවියේ වායු සංයුතිය අනුව වායුගෝලයේ උණුසුම රඳවා ගැනීමට වඩාත් වැදගත්වන වායු වර්ගය වන්ෙ-න්.................................
^ ඔක්සිජන් / කාබන්ඩයොක්සයිඩ් /නයිට්‍රජන් )

2' සාගරික කබොල ප්‍රධාන වශයෙන් ....................................... පාෂාණ වලින් නිර්මාණය වී ඇත
^නයිස් / ග්‍රැනයිට් / බැසොල්ට් )

3' මුදුන් කිහිපයක් සහිත විවිධ බෑවුම් වලින් සහ ඉහළ උන්නතාංශයකින් යුත් විහිදෙන භූ රූප.................................
^කඳු පද්ධතිය /කඳු යාය / කඳු වැටිය )

4' පෘථිවි තලයේ සිට කිලෝමීටර 6ක් පමණ දක්වා කලාපය තුළ, වායු ගෝලයේ මුළු වායු පරිමාවෙන් ................................... ක්
පමණ අන්තර්ගත වේ (25% /50% / 60%)

5' """""""""""""""""""""".;ඔය පදනම් කරගෙන ඉදිකරන ලද ජලාශයකි. ( ඉගිනියාගල / ඉගිනිමිටිය /බෝවතැන්න )

6' පෘථිවි පෘෂ්ඨයේ රැස් වූ ශක්තිය එහි රැඳවුම් ධාරිතාව ඉක්මවූ කල .................................. මඟින් එය මුදා හරිනු ලබයි
^ සංවහන ධාරාවක් / තල ගැටීමක් / භූමි කම්පාවක්)

7' ලෝකයේ ඇති අධිජන සංකේන්ද්‍රණ බහුලවම................................. ප්‍රදේශවල ව්‍යාප්ත වී තිබීම විශේෂ ලක්ෂණයකි
^ආසියාතික / නිවර්තන / වෙරළබඩ)

8' රටකට අයත් මුහුදු සීමාව තිරණය කරන අන්තර්ජාතික සාගර නිතිය .................................. දින සිට ලෝකය පුරා ක්‍රියාත්මක වේ
^ 1984 නොවැම්බර් 16 / 1994 නොවැම්බර් 16 / 1998 දෙසැම්බර් 16 )

9' ඉතා ඉහළ උපත් අනුපාතයක් සහ පහළ මරණ අනුපාතයක් පැවතිමෙන් කෙටි කාලයක් තුළ ජන සංඛ්‍යා.................................
සිදුවිය හැක ( ස්ඵෝටනයක් / වර්ධනයක් / ව්‍යාප්තවීමක් )

10' ශ්‍රි ලංකාවේ උතුරු පළාතේ ජනතාව පරිභෝජනය සඳහා ජලය සපයා ගන්නා ප්‍රධාන මූලාශ්‍රය .................................. වේ
^ අහස් දිය / ගංගා ජලය / භූගත ජලය )

**11 සිට 15 තෙක් දී ඇති එක් එක් ප්‍රකාශය කියවා බලා, එය නිවැරදි නම් ''නි'' යන්න වටා ද, වැරදි නම් ''වැ'' යන්න වටා ද රවුමක් අඳින්න.**

11' මෙට්‍රික් සිතියම්වල දිශා සටහනේ අර්ධ ඊ හිසකින් නිරූපණය වන්නේ ජාල උතුරයි ( නි/වැ)

12' ඉන්දු - ශ්‍රී ලංකා දේශසීමාවට අයත් මන්නාරම් මුහුදු කලාපය පෝක් සමුද්‍ර සන්ධිය හා බෙන්ගාල බොක්ක යන කලාපයේ මුහුදු සීමාව ඓතිහාසික ජල ප්‍රදේශය ලෙස හැඳින්වේ ( නි/වැ)

13' 2012 වර්ෂයට අනුව ශ්‍රී ලංකාවේ කාර්මික අපනයනයන්හි විදේශ විනිමය ඉපයීම 23% ලෙස වාර්තා විය ( නි/වැ)

14' ,වණිකරණයට ප්‍රධාන හේතුවක් වන්නේ වැඩි වශයෙන් වාරි ජලය ගොඩබිම්වලට යොදා ගැනීමයි ( නි/වැ)

15' බෝග වගාවේදි ජාන තාක්ෂණය භාවිතය තුළින් පරිසර හිතකාමි ලෙස කෘෂි කාර්මික නිෂ්පාදන කටයුතු සිදු කර .; හැක ( නි/වැ)

**16 සිට 20 තෙක් දී ඇති ප්‍රශ්නවල ''අ''සහ ''ආ'' යනුවෙන් තීර දෙකක් දක්වේ. ඒවා සම්බන්ධතාව අනුව ගැළපූ විට පිළිතුරට හිමි අංකය තිත් ඉර මත ලියා දක්වන්න.**

16' මෙට්‍රික් සිතියම්වල පර්යන්ත තොරතුරු පිළිබඳ දි ඇති තොරතුරු ගලපන්න

| ''අ'' | ''ආ'' |
|---|---|
| 1 – සිතියම් වර්ගය | A. මුහුණත |
| 2 - ජාත්‍යන්තර බණ්ඩාංක අගය | B. ඇතුළු මායිම් තීරුව |
| 3 - පරිමාණය | C. ඉහළ වට තීරුව |
| | D. පහළ වට තීරුව |

BCD (2) DAB (3) CBD (4) ACB (..........)

17' ශ්‍රී ලංකාවේ විදුලිබලාගාර කිහිපයක් ''අ'' තීරුවේ ඇත. එම විදුලි බලාගාර පිහිටුවීමට මුල් වූ ගංගා කිහිපයක් ''ආ'' ;ීරයේ ද දක්වේ. ''අ'' සහ ''ආ'' තීරු නිවැරදි ව ගැළපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

| ''අ'' | ''ආ'' |
|---|---|
| 1 - සමනල වැව | A. මහවැලි ගඟ |
| 2 - කැනියන් | B. මාදුරු ඔය |
| 3 - රංටැඹේ | C. කැළණි ගඟ |
| | D. වළවේ ගඟ |

(1) CBA (2) DAC (3) DCB (4) DCA (..........)

**18.** ශ්‍රී ලංකාවේ වනාන්තර ප්‍රභේද කිහිපයක් ''අ'' තීරුවේ ද, ඒවායේ බහුලව දැකිය හැකි ශාක වර්ග ''ආ'' තීරුවේ ද දක්වේ. ''අ'' සහ ''ආ'' තීරු නිවැරදි ව ගැළපූ විට ලැබෙන පිළිතුර කුමක් ද?

| ''අ'' | ''ආ'' |
|---|---|
| 1' කඳුකර තෙත් වනාන්තර | A - කිරළ, ගොඩපර |
| 2' කඳුරට වියළි කලාපීය වනාන්තර | B - සපු , කීන |
| 3' කටුපඳුරු හා ළඳු කැලෑ | C - අරළු , මහරත් මල් |
| | D - පලු , වීර |

(1) BCD (2) CBA (3) BDC (4) CBD (..........)

**19.** ශ්‍රී ලංකාවේ බහුලව දක්නට ලැබෙන පාංශු කලාප කිහිපයක් ''අ'' තීරුවේ ද, ඒවා ව්‍යාප්ත වී ඇති ප්‍රදේශ ''ආ'' තීරුවේ ද දක්වේ. ''අ'' සහ ''ආ'' තීරු නිවැරදි ව ගැළපූ විට ලැබෙන පිළිතුර තෝරන්න

| ''අ'' | ''ආ'' |
|---|---|
| 1' සොලිඩෙක්ස් පස | A - දමන හා තමන්කඩුව |
| 2' රතු කහ ලැටසෝල් පස | B - පහතරට තෙත් කලාපීය දිස්ත්‍රික්ක |
| 3' චූර්ණමය නොවූ දුඹුරු පස | C - පුත්තලම සිට මුලතිව් දක්වා වෙරළබඩ ප්‍රදේශ |
| | D - අම්පාර හා මඩකලපුව දිස්ත්‍රික්ක |

(1) DCA (2) ACD (3) CAB (4) BCD
(..........)

**20.** ලෝකයේ මහාද්වීප කිහිපයක නම් ''අ'' තීරුවේ ද, ගංගා කිහිපයක් ''ආ'' තීරුවේ ද දක්වේ. ''අ'' සහ ''ආ'' තීරු නිවැරදි ව ගැළපූ විට ලැබෙන පිළිතුර කුමක් ද?

| ''අ'' | ''ආ'' |
|---|---|
| 1' ආසියාව | A - කොංගෝ |
| 2' උතුරු ඇමරිකාව | B - වොල්ගා |
| 3' අප්‍රිකාව | C - ලීනා |
| | D - මැකැන්සි |

(1) ADC (2) ADB (3) CAD (4) CDA (..........)

**21 සිට 26 දක්වා ඇති ප්‍රශ්නවල හිස්තැන්වලට සුදුසු වචන යොදා සම්පූර්ණ කරන්න.**

21' මරියානා හා මින්ඩනාඕ යන අගාධ පිහිටා ඇත්තේ ....................................................... සාගරයේය

22' ශ්‍රී ලංකාවට බලපාන නිවර්තන වාසුළි ........................................... ආශ්‍රිත සාගරික ප්‍රදේශය ඇසුරු කරගෙන උපත ලබයි .

23' 2012 වර්ෂයේ රටවල් 187 ක මානුෂ සංවර්ධක දර්ශක අගය අතරින් ශ්‍රී ලංකාව ...................................... වන ස්ථානය හිමිකරගෙන ඇත.


24' දකුණු අක්ෂාංශ 23 $1/2^0$ .............................. නිවර්තනය ලෙස හඳුන්වයි

25' නිශ්චිත භූමි ඒකකයක් තුළ ජීවත්වන ජන සංඛ්‍යාව ...................................... නමින් හඳුන්වයි .

26' ලෝකයේ තිරිඟු වගාවේ ව්‍යාප්තිය සඳහා අවශ්‍ය සාධක අතර ...................................... පස වැදගත් තැනක් ගනී

**27 සිට 28 දක්වා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා දී ඇති ප්‍රස්තාරය යොදා ගන්න.**

සංගණන වර්ෂ අනුව ජන සංඛ්‍යාවේ වර්ධනය




**27' 1871** සිට 2012 දක්වා ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යා වර්ධනය ප්‍රස්තාරයට අනුව .......................................................... වර්ධනයක් සිදුවේ

**28' 2012** වර්ෂයේදී ආසන්න වශයෙන් ............................................................ප්‍රමාණයක් ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාව පෙන්වයි.

29';ර්යක් නිම්න හා ආයත ගංගා නිම්න ලක්ෂණ හඳුනාගත හැක්කේ ................................................. ජලවහන රටාව ආශ්‍රිතවය

30' පාරිසරික විසංතුලනය වලක්වා ගනිමින් පරිසර සමතුලිත බව ආරක්ෂා කර ගැනීම සඳහා වර්තමානයේ ශ්‍රී ලංකාව """"""""""""""""""""""""""සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කර ඇත.

**31** **සිට** 40 **දක්වා ඇති එක් එක් ප්‍රශ්නයට දී ඇති පිළිතුරු හතර අතුරෙන් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා, ඊට හිමි අංකය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියා දක්වන්න.**

31' පෘථිවියේ සමස්ථ ගොඩබිම් ප්‍රතිශතයෙන් 29%, 9.2%, සහ 6.7% අයත් කර ගන්නා මහාද්වීප අනුපිළිවෙළින් දැක්වෙන පිළිතුර කුමක්ද?

(1) උතුරු ඇමරිකාව, අප්‍රිකාව, යුරෝපය (2) අප්‍රිකාව, උතුරු ඇමරිකාව, යුරෝපය
(3) ආසියාව, ඇන්ටාර්ටිකාව, ඕස්ට්‍රේලියාව (4) ආසියාව, ඇන්ටාර්ටිකාව, යුරෝපය (..........)


32' සුළු අපනයන බෝගයක් වන කජු වගාව බහුලව වගා කරන දිස්ත්‍රික්කය වන්නේ,

(1) කළුතර (2) පුත්තලම
(3) මාතර (4) මහනුවර (..........)

33' ජෛව ගෝලයේ ක්‍රියාකාරිත්වය කෙරෙහි බලපාන සාධක දෙක නිවැරදිව දැක්වෙන පිළිතුර කුමක්ද ?

(1) සූර්යයා හා ජලය (2) පස හා දේශගුණය
(3) වියෝජකයින් හා ශාක (4) ජෛව සාධක හා අජෛව සාධක (..........)

පහත රූප සටහන උපයෝගී කර ගෙන ප්‍රශ්න අංක 34 සිට 36 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න,




**34'** මෙම රූපසටහනේ A-B රේඛාවෙන් දක්වා ඇති භූ ලක්ෂණය වන්නේ,

(1) සුළං කපොල්ලයි (2) ජල කපොල්ලයි (3) දිය බෙත්මයි (4) දූර්ගයයි (..........)

35' මෙම රූපසටහනේ C - D රේඛාවෙන් දක්වා ඇත්තේ

(1) උත්තල බෑවුමකි (2) දළ බෑවුමකි (3) මොහොර බෑවුමකි (4) අවතල බෑවුමකි (..........)

36' මෙම රූපසටහනේ E - F රේඛාවෙන් දක්වා ඇත්තේ

(1) නෙරුවකි (2) නිම්නයකි (3) කොත් කන්දකි (4) උත්තල බෑවුමකි (..........)

37' ශ්‍රී ලංකාවේ කුරුළු පාරාදීසයක් ලෙස ප්‍රචලිත උතුරු පළාතේ පිහිටි අභය භූමිය වන්නේ,

(1) බිබෝව (2) මඩුපාර (3) ආනවිලුන්දාව (4) චුන්ඩිකුලම් (..........)

38' මෙට්‍රික් සිතියම්වල භාවිත භූ ලක්ෂණ අතරින් සැබෑ භූමිය තුළ විද්‍යමාන **නොවන** ලක්ෂණයක් වන්නේ,

(1) වෘක්ෂලතා වර්ග (2) මාර්ග රටා (3) මායිම් වර්ග (4) ජලවහන රටා (..........)

අංක 39 සහ 40 ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීමට පහත සඳහන් ප්‍රකාශ උපයෝගී කර ගන්න

A. දළ ජාතික නිෂ්පාදනය

B. ජන සංඛ්‍යා වර්ධන වේගය

C. ඛණිජ සම්පත් ක්ෂය වීම

D. ඒක පුද්ගල ආදායම

E. ශ්‍රම බලකාය

F. කාර්මික නිෂ්පාදනය

39' එක් සාධකයක වැඩිවීම නිසා එමඟින් තවත් සාධකයක වැඩිවිම කෙරෙහි බලපෑමක් ඇති කරන බවට දැක්වෙන ප්‍රකාශ අඩංගු අක්ෂර දෙක ඇතුළත් පිළිතුර වනුයේ

(1) A හා B ය (2) A හා C ය (3) A හා D ය (4) A හා F ය (..........)

40' එක් සාධකයක අඩුවීම නිසා අනාගතයේදී අනෙක් සාධකයේද අඩුවීමක් අපේක්ෂා කළ හැක්කේ කවර සාධක යුගලයේද?

(1) A හා F ය (2) B හා E ය (3) C හා F ය (4) D හා E ය (..........)